# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනයː- 2002-04-04 වන දින පස් වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ
3. එස් මුදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
4. එස් සංගරපිල්ලේ මහතා ආරාධිත
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. සී එන් ගලහිටියාව මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
7. ජේ දොඩම්ගොඩ මහතා ජ්. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජ්. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී කරුණු කිහිපයක්ම සාකච්ඡාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

03. වතු උපලේඛනය තැපැල් කිරීම සහ ආපසු ගෙන්වා ගැනීමේ කටයුතු තැපැල් මාර්ගයෙන් ඉටු කෙරෙන බැවින් ඒ සඳහා ලිපිකවර අඟල් 7'' X 10'' ප්‍රමාණයේ 30,000ක් මුද්‍රණ සංස්ථාවෙන් මුද්‍රණය කර ගැනීමට අනුමැතිය ලැබිනි.

04 ලිපි කවරවල මුද්දර ගැසීමේ යන්ත්‍රයක් (Stamping Machine) යොදා ගෙන මුද්දර ගැසීම සඳහා යන්ත්‍රයක් 3 වන අංශයට ලබා ගැනීම දුෂ්කර නම් ප්‍රධාන කාර්යාලයේ මුද්දර ගැසීමේ යන්ත්‍රයෙන් එදිනෙදා යැවෙන ලිපි වලට මුද්දර ගසා තැපැල් කිරීමට සිදුවන බව දන්වන ලදි. කෙසේ වුවද ආපසු එවීම සඳහා වතු උපලේඛන යැවෙන කවරවල බහා මුද්දර අලවන ලද ලිපිකවරයක් යැවීම ට අවශ්‍ය වන මුද්දර (දළ වශයෙන් 10,000) 3 වන අංශය මගින් මිලයට ගැනීමට දන්වන ලදි.

05 අනතුරුව සාකච්ඡා කළේ ගණන්ගන්නා නිලධාරීන් පුහුණු කිරීම සඳහා සකස් කරන ලද උපදෙස් සංග්‍රහයේ (Training Guide) අන්තර් ගතව ඇති කරුණු වූ අතර එය ඉදිරි රැස්වීම් වලදී වැඩිදුර අධ්‍යනය කිරීමට නියමිතයි.

06 සංගණන ප්‍රශ්නාවලියේ රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම ඇතුළත් කිරීම අවශ්‍ය බව දන්වන ලදි.

07 ගණන්ගන්නා නිලධාරීන්ට උපලේඛන බාරදීම සහ ආපසු බාරගැනීම සඳහා සකස් කළ ආකෘතියක 'කෙටුම්පත සලකා බැලූ කමිටුව එය ද්‍රවිඩ භාෂා පරිවර්තනය ද ඇතුළත් කොට පිටපත් 3,000ක් මුද්‍රණය කරවා ගැනීමට තීරණය විය. F1 ලැයිස්තු ක්ෂේත්‍ර කටයුතු සඳහා මුදා හැරීමේ දී දිස්ත්‍රික් ජේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් පෞද්ගලිකවම වගකීමට බැඳී සිටින බව අවධාරණය කළයුතු බව සඳහන් විය. තවද ආකෘති ආපසු එවීමේ දී අත්සන් කොට අඩුපාඩු නොමැති බව සහතික කිරීම එසේ අඩුපාඩු සහිත නම් ගෙවීම් නොකිරීමට වගබලා ගැනීම වැනි කරුණු පිළිබඳව ද දිස්ත්‍රික් ජේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් දැණුවත් කිරීම අත්‍යාවශ්‍ය බවද සඳහන් විය.

08 සංගණන අධිකාරී පත්කිරීම පිළිබඳ ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම සහ දිස්ත්‍රික් සංගණන කොමසාරිස්වරු සහ නියෝජ්‍ය කොමසාරිස්වරු පත්කිරීම ආදි කටයුතු සම්බන්ධ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු සඳහා එස් සංගරපිල්ලේ මහතා අවශ්‍ය පියවර ගනු ඇත.

09 අනතුරුව සාකච්ඡා කෙරුණේ කෘෂිකම් සංගණනයේ කටයුතු සඳහා ජන සංගණනයේ සංගණන ඒකක පූර්ව ලැයිස්තු ගත කිරීමේ ආකෘති (F1 forms) 14 වන අංශයෙන් ලබා ගැනීම පිළිබඳවය. ඒම ලේඛන මුදා හැරීම සඳහා 14 වන අංශයේ අධ්‍යෂක එච් ආර් ගුණසේකර මහතාගේ පූර්ණ සහයෝගය ලබා ගැනීමට තීරණය විය.

10 මෙම ජන සංගණන (F1 forms) ආකෘතින් ලැබී ඇති සියල්ල ලේඛන ගතකොට (Preparing an Inventry) ඉරී කැඩී ගොස් ඇති ආකෘතින් අලවා ප්‍රකෘති කොට බැඳීම ( Binding) ආකෘතින් අස්ථාන ගත වි ඇති සියල්ල සහ නොලැබී ඇති සියල්ල නිශ්චිතව දැනගැනීමටත් දැනට ලැබී ඇති ජන සංගණන (F1 forms) පූර්ව ලැයිස්තු ගත කරන ලද ආකෘතීන් ඒ ඒ ප්‍රදේශීය කොට්ඨාශ මට්ටමෙන් මිටි බැඳීමට ද ඉතා කඩිනම් වැඩ පිළිවෙලක් සැකැසීම අවශ්‍ය බැවින් එම කාර්යය සංවිධානය කිරීම හා සම්බන්ධකරණය කිරීම නියෝජ්‍ය අධ්‍යක්ෂ සී එන් ගලහිටියාව මහතාගේ සේවාව ලබා ගැනීමට තීරණය විය.

11 මෙම කටයුත්ත ඉටු කරදීම සඳහා සංගණන අංශයට අනුයුක්ත කොට ඇති සංඛ්‍යාලේඛනඥ එම් ඩී එම් ප්‍රනාන්දු මහතාගේ මූලිකත්වයෙන් මුද්‍රණ අංශයේ සංඛ්‍යාලේඛන රාජපක්ෂ මහතා සහ සංගණන අංශයට මැතක දී අනුයුක්ත කරන ලද පොත් බඳුම් කරු සහ කෘෂිකම් අංශයේ සංඛ්‍යාලේඛන නිලධාරීන් වන පී නන්දසේන / පී ආර් මුනසිංහ යන මහතුන්ගෙන් සමන්විත කණ්ඩායමක් යෙදවීමට ද තීරණය විය. ඒ අනුව මෙම කාර්යය සඳහා වහාම එම කණ්ඩායමට ක්‍රියාත්මකවීමට දැණුම්දීමට නියමිතය.

12 ජන සංගණන (F1 forms) පූර්ව ලැයිස්තු ගත කරන ලද ආකෘතීන් අස්ථාන ගත වී හෝ නොමැති ග්‍රාම නිලධාරි වසම් වල එම ලැයිස්තු නැවත ලේඛනගත කිරීමේ වැඩපිළිවෙලක් ද කෘෂිකම් සංගණනයට සමගාමීව සිදු කිරීමට ද තීරණය විය.

13 සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව අදහස් විමසීමට දිස්ත්‍රික් ජේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් අප්‍රියෙල් මස අවසන් සතියේ දී පමන ප්‍රධාන කාර්යාලයට කැඳවීමට තීරණය විය.

14 කෘෂිකම් අංශයේ ගරාජය පවතින කොටසේ උඩුමහලේ සංගණන පුහුණු පංති පැවැත්වීමට හැකිවනසේ වායු සමීකරන යන්ත්‍රයක් සහ පුටු 25ක් ලබා දීමට හැකි ඉඩකඩ සලකා බැලීමට තීරණය විය.

15 මිළඟ රැස්වීම 10 - 04 - 2002 දින පෙර වරු 9.45ට පැවත්වෙන අතර එදිනට ගණන්ගන්නා නිලධාරීන් පුහුණු කිරීම සඳහා සකස් කරක ලද උපදෙස් සංග්‍රහයේ (Training Guide) අන්තර් ගතව ඇති කරුණු පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සහ දත්ත සැකසුම් කටයුතු පිළිබඳව පද්ධති විශ්ලේශක/වැඩ සටහන් සම්පාදක මිගාර ප්‍රනාන්දු මහතා සමග සාකච්ඡා කිරීමට නියමිතය.

16 රැස්වීමේ කටයුතු සවස 4.30 ට පමණ අවසන් විය.

ජේෂ්ඨ සංඛ්‍යාලේඛනඥ
(ජේ දොඩම්ගොඩ)

................................

ඉහත ජේදයන් අනුව තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස ඔබේ අවධානය යොමුකරන්න.

අධ්‍යක්ෂ ජනරාල්